**ජාතික මාර්ග ජාලය නායයෑම් ආපදාවලින් ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපෘතිය - 2017**

---

ජාතික මාර්ග ජාලය නායයෑම් ආපදාවලින් ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල්-පී 109 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය, මහාමාර්ග හා නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම, ඌව හා සබරගමුව පළාත්වල උස්බිම් ප්‍රදේශවල සුදුසු ප්‍රතික්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම මඟින් මූලික යටිතල පහසුකම් ලෙස ජාතික මාර්ග සඳහා ඉලක්ක කර නායයෑම් අවදානම අවම කිරීම හා එමඟින් ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා දායකවීම සහ මාර්ග ජාලයේ ආරක්ෂාව වැඩි කිරීම සහ මාර්ග භාවිතා කරන්නන් හා පදිංචිකරුවන් ඇතුළත් ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම ව්‍යාපෘතියේ අරමුණයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,754 කට සමාන ජපන් යෙන් මිලියන 9,841 ක් වූ අතර ඉන් රු.මිලියන 11,423 කට සමාන ජපන් යෙන් මිලියන 7,619 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජූලි 05 දින ආරම්භ කරන ලද අතර 2019 මාර්තු 31 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල

උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 කොන්දේසි සහිත වූ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ විස්තර කරන්නා වූ හේතු අනුව මගේ මතය කොන්දේසි සහිත වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම්, මෙම වාර්තාවේ 2.2 ඡේදවල සඳහන් කරුණු වලින් පැන නඟින ගැලපුම් වලින් සිදුවන බලපෑම හැර, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු. මිලියන 76.5 ක මුදලක් සහ විදේශ උපදේශකවරුන්ට කරන ලද ගෙවීම් මත ආර්ථික සේවා ගාස්තු සහ ආදායම් බදු ප්‍රතිපූර්ණය කිරීම්වල එකතුව රු.මිලියන 2.44 ක් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ආ) දේශීය උපදේශකවරයාගේ පරිහරණය සහ බණ්ඩාරවෙල නේවාසික ඉංජිනේරුවරයාගේ සහ බදුල්ල වැඩබිම් ඉංජිනේරුවරයාගේ කාර්යාලවල පරිහරණය සඳහා ව්‍යාපෘතියේ පැකේජ - 02 යටතේ රු.මිලියන 14.87 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කළ ස්ථාවර වත්කම්, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දේපළ, පිරිවැය හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොමැති බව නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

---------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | **2017 දෙසැම්බර් 31 දිනට** | |
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ජජාසනි | 7,619.00 | 11,423.00 | 1,270.00 | 911.47 | 1,212.79 | 1,405.53 | 1,826.17 |
| ශ්‍රීලංර | 2,222.00 | 3,331.00 | 278.00 | 105.53 | 140.41 | 203.32 | 263.03 |
| | **9,841.00** | **14,754.00** | **1,548.00** | **1,017.00** | **1.353.20** | **1,608.85** | **2,089.20** |

ඉහත තොරතුරු අනුව, 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ වී වසර 3 ½ ක් ගත වුවද ණය ලබා දෙන නියෝජිතායතනය විසින් සපයන ලද රු.මිලියන 11,423 කට සමාන ජපන් යෙන් මිලියන 7,619 ක මුළු වෙන්කිරීම් වලින්, රු.මිලියන 1,826.17 කට සමාන ජපන් යෙන් මිලියන 1,405.53 ක මුදලක් එනම් මුළු වෙන් කිරීම් වලින් සියයට 16 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

මාර්ග ආපදා කළමනාකරණ සඳහා මධ්‍යම, ඌව සහ සබරගමු යන පළාත්වල හඳුනාගත් ස්ථාන 16 ක ප්‍රතික්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා පැකේජ 02 ක් යටතේ රු.මිලියන 6,094.48 ක ඇස්තමේන්තුගත පිරිවැයකට 2017 මාර්තු 01 දින කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබූ අතර 2019 මාර්තු 21 දින ඉදිකිරීම් වැඩ නිම කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ වැඩ සැලසුම් අනුව, 2017 දෙසැම්බර් 31 වන විට පැකේජ 01 සහ පැකේජ 02 යටතේ භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 24.5 ක් සහ සියයට 38.12 ක් ළඟා කර ගත යුතු වූ අතර එදිනට ප්‍රගතිය පිළිවෙලින් සියයට 1.95 ක් සහ සියයට 34.88 ක් ළඟා කර ගෙන තිබුණි. ප්‍රතික්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම, 2017 මාර්තු 24 දින පැකේජ 01 යටතේ කොන්ත්‍රාත්කරුවෙකු සමඟ එළඹුණ ද විගණිත දින වූ 2018 සැප්තැම්බර් 12 දින වන විටත් රම්බොඩ, තැලිගම, පිටවාල සහ ගිණිගත්හේන වැඩබිම්වල ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද, 2017 දෙසැම්බර් 31 දිනට වෙනත් වැඩබිම් 09 ක ඉදිකිරීම් වැඩවල අඩු ප්‍රගතියක් වාර්තා වී තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පැකේජ 01 යටතේ කැප්පෙටිපොළ හා ටොප්පාස් වැඩබිම්වල ඉදිකිරීම් කටයුතු ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 357 කට රාජ්‍ය සංස්ථාවක් වෙත පිරිනමා තිබුණි. ව්‍යාපෘතියේ පැකේජ 02 යටතේ බද්ධ ව්‍යාපාර හවුල්කරුවෙකු ලෙස ඉදිකිරීම් කටයුතුවලට සම්බන්ධ වී සිටින කොන්ත්‍රාත්කරු, උප කොන්ත්‍රාත්කරුවෙකු ලෙස යොදා ගෙන කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් වැඩ කර ගෙන යමින් පැවති බව 2018 ඔක්තෝබර් මස කරන ලද භෞතික වැඩබිම් පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) 2013 ජනවාරි 16 දිනැති අංක: 13/0076/504/005 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව, ව්‍යාපෘතිය විසින් උස්බිම් ප්‍රදේශවල "ඒ" ශ්‍රේණියේ ජාතික මාර්ගවල සුදුසු ප්‍රතික්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතු වේ. කෙසේ වුවද, ඉහත ප්‍රතිපත්තියට පටහැනිව නාවලපිටිය ප්‍රදේශයේ "ඒබී" ශ්‍රේණියේ මාර්ගයක් ප්‍රති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 412.65 ක ඇස්තමේන්තුගත පිරිවැයකට පැකේජ 01 යටතේ තෝරා ගෙන තිබුණි.

(ඇ) ලබා දෙන ලද තොරතුරු අනුව, ව්‍යාපෘතිය යටතේ නාවලපිටිය, කහගල්ල සහ ලුණුගල ප්‍රදේශවල නායයෑම් වළක්වා ගැනීම සඳහා ප්‍රතික්රියාමාර්ගයන් ලෙස නල මාර්ගික ළිං 10 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 490.44 ක ඇස්තමේන්තු පිරිවැයකට කොන්ත්‍රාත් පිරිනමා තිබූ අතර ඉදිකිරීම් වැඩ අවසානයේ වැඩබිම්, දේපළ හිමිකරුවන්ට ලබා දීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, කල් පවත්නා ලෙස ළිං නඩත්තු කිරීම වෙනුවෙන් කිසිදු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) දියගල සහ නාවලපිටිය වැඩබිම්වල නායයෑම් ආපදා අවම කිරීමේ ඉදිකිරීම් කටයුතු සඳහා ගල් අගුළු දැමීමේ ප්‍රතික්‍රියාමාර්ගයන් යොදා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් රු.මිලියන 62.5 ක් වියදම් කර තිබුණි. කෙසේ වුවද මෙම ඉදිකිරීමේ කොටසක් මහ වැසි හේතුවෙන් කඩා වැටී තිබුණු අතර එම නිසා ආරක්ෂක පියවරක් වශයෙන් අනුගමනය කර තිබූ ක්‍රියාපටිපාටිය පිළිබඳ සැකයක් ඇති වී තිබුණි.

(ඉ) පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ ලුණුගල ස්ථානයේ පිහිටා තිබුණු නළ මාර්ගික ළිඳෙන් ජලය පිටාර යෑම වෙනුවෙන් වූ මාර්ගය සහ නළ පද්ධතිය අතර ආරක්ෂිත ප්‍රදේශයක් වෙන් නොකර සවිකර තිබූ බව ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද, ඒ හේතුවෙන් නල පද්ධතියට සිදුවිය හැකි හානි වැළැක්වීමට පියවර ගෙන නොතිබුණි.

(ඊ) රු.මිලියන 43.77 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ස්ථාන 11 ක නායයෑම් සඳහා ප්‍රතික්‍රියාමාර්ගයක් ලෙස බීජ විසුරවීමට ව්‍යාපෘතිය විසින් පියවර ගෙන තිබූ අතර ඉන් රු.මිලියන 3.07 ක් 2017 දෙසැම්බර් 31 දිනට ලුණුගල ප්‍රදේශයේ බීජ විසුරවීම සඳහා වැයකර තිබුණි. 2018 සැප්තැම්බර් මස සිදු කළ ස්ථාන පරීක්ෂාවේදී බීජ විසුරුවීම සිදුකළ ස්ථානවල දේශීය තණකොළ වැවී තිබූ බව අනාවරණය වූ අතර ප්‍රතික්‍රියාමාර්ගික අරමුණු සඳහා බීජ විසුරුවීමේ ව්‍යාපෘතිය සාර්ථක විකල්පයක් නොවන බව මේ අනුව පැහැදිලි වේ.

**3.4 මතභේදයට තුඩුදෙන කරුණු**

-----------------------------

2014 වර්ෂයේදී බලපත්‍රලාභී රජයේ විශේෂිත බැංකුවක් මඟින් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබා ගන්නා ලද ණය මුදලින් රු.මිලියන 09 ක් ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ණය මුදල නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**3.5 මූල්‍ය පාලනයේ ගැටළු**

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අංක: 14.6 උප වගන්තිය අනුව, ඇගයීමේ කටයුතු සඳහා අන්තර් ගෙවීම් සහතිකයක අවම වටිනාකම, එකඟ වූ කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 02 ක් ලෙස තීරණය කර තිබුණි. කෙසේ වුවද, ඉදිකිරීම් වැඩවල දුර්වල භෞතික ප්‍රගතිය හේතුවෙන්

සමාලෝචිත වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද අන්තර් ගෙවීම් සහතික 09 ක් නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරුවන් දෙදෙනා සමඟ අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුම් අනුව, ගෙවීම්වල ස්වභාවය සහ අවශ්‍යතාව නොසලකා පැකේජ 01 හා පැකේජ 02 සඳහා පිළිවෙලින් රු.මිලියන 90.34 ක් හා රු.මිලියන 89.50 ක් පොදු වියදම් යටතේ එකවර ගෙවීම් වෙනුවෙන් ඇස්තමේන්තුගත කර තිබුණි. එම ඇස්තමේන්තු වලින් 2018 ජූනි 30 දින දක්වා කොන්ත්‍රාත්කරුවන් දෙදෙනා විසින් රු.මිලියන 167.6 ක මුදලක් ලබා ගෙන තිබුණි.

(ඇ) ව්‍යාපෘතිය විසින් දේශීය බදු නිදහස් කර ගැනීම වෙනුවෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරුවන්ට සිදුකළ ගෙවීම් මත ව්‍යාපෘතිය විසින් රු.මිලියන 204 ක එකතු කළ අගය මත බදු සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. තවද, රු.මිලියන 2.42 ක් වන ආදායම් බදු සහ රු.මිලියන 3.37 ක් වන උපයන විට ගෙවීම් බදු උපදේශකවරයා වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී දැරීමට ව්‍යාපෘතියට සිදු වී තිබුණි.

### 3.6 මානව සම්පත් කළමනාකරණය

-------------------------------

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දේශීය උපදේශක තනතුර අනුමත කර නොමැති වුවද, 2017 ජූලි මාසයේදී දේශීය උපදේශකවරුන් දෙදෙනෙකු හට පත්වීම් ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය.